# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
# Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය - 2021 | පැය 03 යි |
| கண்டுபிடிப்பு சோதனை | 03 மணி நேரம் |
| Diagnostic Test | 03 Hours |
| සිංහල - II | 12ශ්‍රේණිය |
| சிங்கள - II | தரம் 12 |
| Sinhala - II | Grade 12 |

I කොටසේ 01 ප්‍රශ්නය ද II කොටසේ 02,03 ප්‍රශ්න ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

01. එක් එක් ප්‍රශ්නයට වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1.1. ඌෂ්මාක්ෂර සේ සැලකෙන්නේ කවරක්ද?

(1) ට, ය, ඩ, ඪ, ණ
(2) ශ, ෂ, ස, හ, ෆ
(3) ත, ථ, ද, ධ, න
(4) ප, ඵ, බ, භ, ම
(5) ග, ජ, ඬ, ඳ, ඹ

(..............)

1.2. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරනන් .

(1) කේශාකර්ෂණය, න්‍යෂ්ටික, ශබ්ධාර්ථ, ඡන්දශ්ශාස්ත්‍රය, දළදඬු

(2) ඡන්දස් ශාස්ත්‍රය, දළදඬු, ශබ්දාර්ථ, කේශාකර්ශණය, න්‍යෂ්ටික

(3) දළදඬු, ශබ්දාර්ථ, ඡන්දස්ශාස්ත්‍රය, න්‍යෂ්ටික, කේෂාකර්ෂණය

(4) න්‍යෂ්ඨික, ඡන්දස්ශාස්ත්‍රය, කේෂාකර්ශනය, ශබ්දාර්ථ, දළදඬු

(5) ශබ්දාර්ථ, කේශාකර්ෂණය, න්‍යෂ්ටික, ඡනද් ශ්ශාස්ත්‍රය, දළදඬු

(..............)

1.3. අකාරාදී පිළිවෙළ අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) පතෝල, වම්බටු, නිවිති, තම්පලා

(2) කරවිල, පිපිඤ්ඤා, බෝංචි, මෑ කරල්

(3) වට්ටක්කා, පුහුල්, දඹල, ගොටුකොළ

(4) කතුරුමුරු ංගා, කොහිල, තුඹ, තිබ්බටු

(5) කොස් ඇට, කංකුන්, කැරට්, මුකුණුවැන්න

(..............)

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වදාහරණය ප්‍රකාශය තෝරන්න.

(1) 'යංශය' යනු 'ය' යන්න වෙනුවට යෙදෙන අක්ෂර සංකේතයයි.

(2) 'යංශය' ර කාරයෙන් පරව යෙදේ.

(3) 'යංශයට' පෙර යෙදෙන ව්‍යඤ්ජනය හල් සලකුණ සහිතව යෙදේ.

(4) අන්‍ය ව්‍යඤ්ජනවලට මෙන් හුදකලා යංශයට ද සියලු පිල්ලම් එක් කළ හැකිය.

(5) අනුස්වාරයට පූර්වයෙන් යංශය භාවිත කළ හැකිය.

(..............)

1.5. යංශය, රේඵය, රකාරාංශය හා ගයනකුිත්ත සහිත වචන අනුපිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) වාක්‍යය, ස්වර්ගීය, වක්‍ර, වනෞෂධ

(2) භාග්‍ය, අක්‍රමවත්, බෞතිස්ම, සර්ගීය

(3) ගද්‍යය, අලෞකික, චර්ම, ව්‍රතය

(4) ව්‍යය, අවර්ණ, අබෞද්ධ, ක්‍රය ශක්තිය

(5) ශාක්‍ය, ප්‍රබල, සමර්පණය, මෞන

(..............)

1.6. එකිනෙකට අනුරූප වනසේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) පියෙදු කිරිය, මිහිඳු තෙර, රජමහා විහාරය, අගමැති මනදී රය

(2) සූර්ය මණ්ඩලය, භාරත දේශය, තෑගි ප්‍රදානය, ඡන්දස් ශාස්ත්‍රය

(3) හස්තිශෛල පුරය, විද්‍යුත් ආලෝකය, ථූප වංශය, මූල්‍ය ප්‍රතිපාදන

(4) කානත් ා කාර්යාංශය, රාජ්‍ය සභාව, සන්ධ්‍යා පුවත්, යහ පාලනය

(5) සර සඳ, සුබ පැතුම්, ලිඟු අදියර, අග විනසිුරු

(..............)

1.7.තත්සම වචන පමණක් යෙදී ඇති වරණය කුමක්ද?

(1) නීති, වීථි, භීති, බාති

(2) ආලෝකය, ආලාප, ආහාර, ආකාර

(3) සුන්දර, මන්දර, ගින්දර, කින්නර

(4) දේශික, භාෂිත, බාධිත, සාදන

(5) සිරි, දිරි, පිරි, කිරි

(..............)

1.8. මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) සත්පුරුෂ - අසත්පුරුෂ, දුර්ජන, අසජ්ජන, අඥබාල

(2) උච්ච - පහත්, නීච, අධම, උසස්

(3) දමුණු - අශාන්ත, නොදමුණුු, අසංවර, අදාන්ත

(4) දුර්ලභ - සුලභ, බහුල, අධික, බොහෝ

(5) විදග්ධ - අඥාන, මෝඩ, මූර්ඛ, අවිදග්ධ

(..............)

1.9. මුලින් දී ඇති පදයට සමානාර්ථ පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) ස්වර්ණ- රත්රන්, කනක, හේම, රුවන්

(2) කූටය- මුදුන, මස්තකය, අග්‍රය, කුළ

(3) කුරුල්ලා- විහඟ, පක්ෂියා, ද්විජ, දද

(4) මුහුද- ජලනධි , සමුද්‍ර, අර්ණව, සිඳු

(5) ස්නේහ- පෙම්වත්, ආලවන්ත, ආදරණීය, ළෙනග් තු

(..............)

1.10. කරණ, සබඳ, අදර, කම් හා කතු, යන විභක්ති සමාස පද, පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) ගල්කැටයම්, වනසත්තු, ගොපල්ලා, සත්ත්වලෝකය, පරපුටු

(2) සත්ත්වලෝකය, වනසත්තු, පරපුටු, ගල්කැටයම්, ගොපල්ලා

(3) ගොපල්ලා, සත්ත්වලෝකය, ගල්ගැටයම්, පරපුටු, වනසත්තු

(4) ගල්ගැටයම්, සත්ත්වලෝකය, වනසත්තු, ගොපල්ලා, පරපුටු

(5) ගල්කැටයම්, වනසත්තු, සත්ත්වලෝකය, ගොපල්ලා, පරපුටු

(..............)

1.11.කෘදනත් පදයක් අන්තර්ගත නොවන වරණය තෝරනන් .

(1) ලියමන්, කියමන්, වියමන්, පිසමන්

(2) මැරූ, කියූ, දිවූ, නැහූ

(3)  යනු, එනු, බලනු, දුවනු

(4) කැවිලි, පෙවිලි, දැපිලි, දැම්ලි

(5) වදාළ, විචාළ, අගල, හදාළ

(..............)

1.12. පහත සඳහන් වැකිවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

ගොවියා දරුවා ලවා හරක් බඳවයි.

මමද බුදු වෙම්වා ලොව්තුරා  මව

සොයා දරුවා හඬයි.

ඔහු බසයෙන් බසිද්දි වැටුණේය.

(1) ආශිර්වාද ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා

(2) ප්‍රයෝජ්‍ය ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(3) පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, ආශරී වාද ක්‍රියා

(4) ප්‍රයෝජ්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, ආශරී වාද ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(5) අසම්භාව්‍ය ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, ආශිර්වාද ක්‍රියා

(..............)

1.13.අනුක්ත පද දෙකක් සහ උක්ත පද දෙකක් ඇති පේළිය තෝරන්න.

(1)සොරුන්,ළමයෙක්,අපි,මීයෙක්

(2)ඇතකු,සිංහයෙක්,කුකුළෙක්,හාවෙක්

(3)අඟනක්,ගොවියකු,ලතාවෝ,දෙවියෙක්

(4)ගවයෙක්,ගැහැණියක,හිමයි න්,යකෙක්

(5)දරුවන්,ඉත්තෑවන්,ඌරෙක්,මෑණියෝ

(..............)

1.14.උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය අයත් වරණය තෝරන්න.

(1)සානුකම්පිත, ප්‍රබල, ප්‍රත්‍යුත්ර,සුගන්ධ

(2)නිරනුනාසික,සමලංකෘත,අග්නි,විගමන

(3)දුර්ගුණු,උදුළ,ආයාචන,සම්බාධක

(4)දුබල,අනුමෝදනා,අවමානය,සම්මානය

(5)අත්‍යලංකාර,නිරාහාර,පිළිගනී,විලාප (..............)

1.15."සුරන් සහ සහසැස් නො කර සිටියේ අහස්කුස් හිස්"යන්නෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරෙන් ඇති පද අයත් වන්නේ මෙයින් කුමන ව්‍යාකරණ අංගවලටදැයි

(1) නිපාත,සමාස හා විභක්ති (2)සමාස,නපි

ාත හා විභක්ති

(3) විභක්ති,නපි ාත හා සමාස

(4) විභක්ති,සමාස හා නිපාත (..............)

1.16. ව්‍යාකරණානුකූලව නොගැළපෙන පදයක් ඇති වරණය කුමක්දැයි

(1)වදාළ,වගුළ,මතුළ,හදාළ

(2)ගයමින්,නටමින්,දුවමින්,හඩමින්

(3)කඩිති,දියති,පැනිති,කැදිති

(4)පෞරුෂලයෞවන,උරුමය,අයෝමය

(5)නිලුපුල්,රතදර,අතැගිලි,මුලසුන (..............)

1.17. සමාසයක් නොවන පදයක් ඇතුළත් වරණය තෝරනන් .

(1) ගල්පඩි, රනක් මි, දීබත්, ළමාපොත්

(2) දුදන, දුහුල, දුලද, දුබල

(3) පැරකුම් නිරිඳු, මහඔසුපඩි, දනපල් ඇත්, මලියදෙව්තෙර

(4) සිහවගවලස්, පලුපලමල්, ඇඳපුටුමේස, ඇස්කන්නාස්

(5) වතකමලා, තිසරතන, අතුල්පියුම්, නෙතුපුල (..............)

1.18. එකම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.

(1) අතිනත, දකුණත, දිගත, සුරත

(2) කොස්සැට, උරුමක්කාර, අල්ලස්, පොල්ලත්ත

(3) ශාස්ත්‍රාලය, මුනීන්ද්‍ර, ක්‍රිස්තුත්පත්තිය, යථාර්ථ

(4) ජාත්‍යාලය, විද්‍යාලය, හස්ත්‍යාලංකාර, කාව්‍යාවලිය

(5) පුනරුත්, මෙයාකාර, කටුවල, දෑවුරුදු (..............)

1.19. ව්‍යාකරණානුකූලව නිවරදි වාක්‍ය තෝරන්න.

(1) ඔවුහු කන්ද බසිද්දී ඇතෙක් ඉදිරියට ආවේය.

(2) ඇතැම් සම්ප්‍රදායන් වෙනස් වී ඇත.

(3) වීදාගම හිමියන් ලෝවැඩ සඟරාව රචනා කළහ.

(4) ගංගාවන් මුහුදට ගලති.

(5) මිනිසුන් ධාර්මික වෙත්වා.

(..............)

1.20. වඩාත්ම නිවරදි පද බෙදීම සහිත වාක්‍ය තෝරන්න.

(1) නවකතාවේ ආරම්භය පිළිබඳව මහාචාර්ය සරත්චන්ද්‍ර දරණ අදහස මාර්ටින් වික්‍රමසිංහ සම්පූර්ණයෙන් නොපිළිගනී.

(2) පැරණි කාව්‍යයේ ආකෘතිය පමණක් නොව වස්තු විෂය ද ඒකාකාරී විය.

(3) මධ්‍ය යුගයට අයත් සිංහල කාව්‍ය සාහිත්‍යය කාව්‍ය ග්‍රන්ථ තුනකින් යුක්ත විය.

(4) ලංකාව වැනි ධර්මද්වීපයක බුද්ධෝත්පාද කාලයක කතුවරයාට ඉපදෙන්ට ලැබීම ගැන බෙහෙවින් සතුටු වෙයි.

(5) සාහිති ය කෘතියක කර්තෘ සොයාගත හැක්කේ හොඳ සංස්කරණයන්ගේ ආධාරයෙනි.

(..............)

## II කොටස

(01) (අ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිංහල සංස්කෘතිය භාරතීය සංස්කෘතිය පදනම් කොට ඇතත්, ස්ථවිරවාද බුද්ධාගම නිසා එය භාරතීය හින්දු සංස්කෘතියෙන් වෙන් වූවක් බවට පත් විය. සිංහල සංස්කෘතියට බුද්ධාගමේ ඇති සම්බනධ යත්, භාරතීය සංස්කෘතියට හින්දු සමයයෙහි ඇති සම්බනධ යත් එක හා සමාන නොවේ. අතීතයේ පටන් ම බුද්ධ ධර්මය සාමුහික ලෙස කරන ආගමික වැඳුම් පිදුම්වලින් තොර වතාවත් අඩු ධර්මයක් විය. අදත් ඒ

එසේම ය. මේ හැරුණු විට යාඥාවට හෝ උත්තර මානුෂීය බල ඇති අයට කරන ආයාචනයකට හෝ තැනක් බුද්ධාගමේ නැත. එහෙත් ඒ වෙනුවට පෞද්ගලිකව කැරෙන ආත්ම දමනයෙන් ලැබීමත්, සංස්කාරයන්ගේ අනති ය ය මෙනෙහි කිරීමෙන් පුහුණු කිරීමත් උගන්වනු ලැබේ. මේ අනුව ජීවිතය ගැන බුද්ධ ධර්මය දරන දෘෂ්ටිය පෞද්ගලිකත්වය වටා ගෙතුණු අතර ම වඩා ප්‍රඥාගෝචර ද වෙයි. වෙනස්

කළ නොහැකි ලෙස ක්‍රියාත්මක වන කර්මඵල නයි මයක් ගැන එහි අවධාරණයෙන් කියවේ. මේ කර්මඵල නයි මය කෙරෙහි එක ම ස්වාමියා මිනසි ා ය. ලෝකෝත්තර බලවේගයන්ගෙන් කිසි පිහිටක් නොලැබේ. දේව භක්තිය මත පදනම් වූ ආගාමකට වඩා බුද්ධ ධර්මය වෙනස් ය. දේව භක්තිය මත ගොඩනැංවුණු ආගමක දී දෙවියන් හා මිනිසුන් අතර පැවැත්වෙන සම්බනධ් කම් විවිධ ක්‍රම ගන්නා අතර, ඒවා එම ජන සමාජයෙහි සංස්කෘතියේ ම අංග බවට පත් වේ. මේ නසි ා බුද්ධ ධර්මය ඉහත කී විධියේ ලෞකික සංස්කෘතියකට අවශ්‍ය සම්පූර්ණ අංගෝපාංග, එය අනගු මනය කරන සමාජයට නොදෙයි. ගම්බද සිංහල ජනයාගේ අවශ්‍යතාවනට සරිලන ලෙස සකස් වීම සඳහා බුද්ධ ධර්මයට ජන ඇදහීම් හා හින්දු විශ්වාසයන ් සමඟ සංකලනය වීමට සිදු විය.

(i) භාරතීය හින්දු සංස්කෘතියෙන් සිංහල සංස්කෘතිය වෙනස් වූයේ කුමක් නිසාද?

( ii ) මේ ඡේදයේ සඳහන් වන පරිදි බුද්ධ ධර්මයේ විශේෂ ලක්ෂණ දෙකක් පහදා දෙන්න.

( iii ) මේ ඡේදයෙහි දැක්වෙන පරිදි බුදු සමයයෙහි ඇති ඉගැන්වීම් පහදා දෙන්න.

(iv) ගම්බද ජනයා ඔවුන්ගේ අවශ්‍යතාවලට සරිලන පරිදි බුදු දහම සකස් කර ගත්තේ කෙසේ ද?

(v )අධ්‍යාත්මික පාරිශුද් ධිය, නෛෂ්ක්‍රම්‍ය යන වචනවල අරුත් පැහැදිලි කරන්න. (ල.15)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

පාඨක ජනයාත් විචාරකයාත් එක් අවස්ථාවක ඉතා ඉහළින් අගේ කළ කෘතිය තව වරෙක නොතකා හැරීමේ අවස්ථා සාහිත්‍ය ලෝකයේ හිඟ නොවේ. එක් අවධියක එක් සාහති ්‍යාංගයක් ජනප්‍රිය වන අතර, තවත් අවස්ථාවක අනෙක් සාහිත්‍යාංගයක් ජනප්‍රිය වනු ඇත. මෙවැනි ධර්මතා සහ ඒවාට පසුබිම් වූ හේතු සාධකාදිය විභාග කිරිමත් මෙම අධ්‍යයනයට අයත් වෙයි. ඇතැම් ලේඛකයන්ගේ කෘති සාධු සම්මත වූයේත් ශ්‍රේෂ්ඨ නිර්මාණ ලෙස පිළිගැනුණේත් ඒ කර්තෘන් මිය පරලොව ගියාට ද පසුව බව අපි දනිමු. අනෙක් අතින් ඇතැම් කෘති එහි කර්තෘවරයා ජීවත්ව සිටිය දී හෝ ඔහතු ් සමඟ ම අභාවයට යනු පෙනේ. තවත් කෘතියක් එදාත් අදත් හෙටත් ප්‍රශංසාවට ම පාත්‍ර වනේ න් ය. ඇතැම් කෘතියක් ශ්‍රේෂ්ඨ නිර් මාණයක් සේ මුලින් පිළිගැනෙනුයේ එම කෘතිය බිහි වූ දේශය තුළ නොව, අනෙක් රටක විය හැකි ය. මේ සියල්ල සිදුවන්නේ හෙත් ු රහිතව නොවේ. මෙවැනි කරුණු විභාග කිරීමත් සමාජීය සාහති ්‍ය අධ්‍යයනයට පැවරෙන වගකීමක් වෙයි.

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිතයක්ව සිටීමේ දායාදයක් වශයෙන් ඉංග්‍රීසි සාහති ්‍ය කෘති මෙරට පාඨකයා අතර පැතිරුණ අතර, එක් අවධියක ප්‍රංශ හා රුසියානු සාහිත්‍යයෙන් ජනප්‍රිය වීමට හේතු තිබිය යුතු ය. පිහිටීම අතිනුත් ඓතිහාසික හා සංස්කෘතික සම්බනධ් තා අතිනුත් අපට වඩාත් සමීප රට වන ඉන්දියාවේ චිරන්තන සාහිත්‍යයත්, සිහිත්‍ය විචාර වාදත් මෙහි නොඅඩුව ප්‍රචලිත වූ නමුත් වර්තමාන සාහිත්‍යය සම්බනධ් යෙන් එසේ නොවීමට හේතු කවරේ ද? සිංහල පාඨකයා අන් හැම සාහිත්‍යයකට ම වඩා අඩුවෙන් දන්නෙ ් අපේම සහෝදර ජනතාව වන දෙමළ ජනයාගේ සාහති ්‍ය ය නොවේද ? (ලකුණු 15 යි)

(03) දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300-350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූලව ලියන්න.

(1) රටක සංවර්ධන ක්‍රියාවලියෙහි ලා ආත්මාර්ථයෙන් තොර දේශපාලන සංස්කෘතියක ඇති වැදගත්කම.

(2) ශ්‍රී ලංකාවේ ඉගැන්වීමේ ක්‍රියාවලියට විද්‍යුත් මාර්ගගත (online) ක්‍රමය හඳුනව් ාදීම.

(3) වසංගත රෝග ව්‍යාප්තිය මඟින් ගෝලීය ආර්ථිකයෙහි පැවැත්ම කෙරෙහි සිදු කෙරෙන බලපෑම.

(4) වසර ගණනාවක් පුරා පැවැතෙන අලි - මිනසි ් ගැටුම විසඳීමේ යෝග්‍යතාවය.

(5) මෙරට කෘෂිකර්මාන්ත ය නගා සිටුවීමට කාබනික පොහොරවල වැදගත්කම.

(ලකුණු 25යි)

(04)(අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිර්දෝෂ කොට ලියන්න.

(1) මිතුරන් විසින් මගේ සුවදුක් බලන ලද්දෙමි.

(2) ගං වතුරින් අනාථ වූවන් කවුරුන් බලා ගනිත් ද?

(3) මම ජයග්‍රහණය නොකළොත් මිතුරිය දුක් වන්නීය.

(4) නිල් අහසේ තාරකා ද සැදෑ වලා ද දිස් විය.

(5) අප සියල්ලෝම පෝයට අනුරාධපුරයට ගියෙමු.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්ම කාරකයට හරවන්න.

(1) ඇතැම් වෙළෙන්දෝ පාරිභෝගිකයින් රවටති.

(2) අතීතයේ වැද්දෝ සොරබොර වැවාණන් හොඳින් රැකබලා ගත්හ.

(3) අක්කා තම නංගීට මල් කිනිත්තක් දෙයි.

(4) මුරකරුවා නයි මිත වේලාවට සීනුව ගසයි.

(5) හෙදිය රෝගී දරුවන් සැනසුවාය.

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියනන් .

(1) දඹදිව යන වන්දනා (කරුවෝ / කරුවන්) කායික මෙන්ම මානසිකවත් නිරෝගී විය යුතුය.

(2) අධමයෙන් දනය (සපයන්නෝ / සපයන්නන්) අපාගත වන බව සිතට ගත යුතුය.

(3) කුසල් රැස් (කරන්නෝ / කරන්නන්) දෙලොවම ජය ගනු ඇත.

(4) තාත්තා හෝ අම්මා හෝ අද මා බැලීමට නේවාසිකාගාරයට (එන්නේය / එන්නයි )

(5) මහගම (සේකරයන් / සෙකරයෝ) ගී නිර්මාණ රැසක් කළහ. (ල.5 යි)

(05)

(I) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් දක්වා ඇති පදවල අර්ථ විග්‍රහ කරනන් .

(i) කාව්‍යයක <u>වක්‍රෝක්තිය</u> ගැබ්විය යුතු ය. යන්න අලංකාරවාදීන්ගේ අදහස විය.

(ii ) ඔහු <u>දේශදේශාන්තරයෙහි</u> ප්‍රකට විද්වතෙකි.

(iii ) අනුරාධපුරය අසලින් <u>මෙහෙණවරක</u> නටබුන් හමුව ඇත. (ල.3 යි)

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් සුදුසු තනිපද ලියන්න.

(I) බොහෝ ඇසූ පිරූ තැන් ඇති -

(II) තම මතයට ම අනුව සිතන -

(III) තම ජන්මභූමියට විරුද්ධව ක්‍රියා කරන්නා -

(ඉ) පහත දී ඇති වාක්‍යවල හිස්තැනට වඩාත්ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(I) සාහිත්‍ය රසවින්දනය හා විචාරය උදෙසා ....................... මාර්ගයක් වෙත අවතීර්ණ විය යුතු ය

.(II) ප්‍රවීන ගායකයා ........................ වේදිකාව පසුපස හඬා යන්නෙක් නොවේ.

(III) ලෝකයේ සමහර රටවල ............................. ස්ථාවරත්වයක් නොමැති බව පෙනී යයි.

(IV) නළුනළි කණ්ඩායම සහා ............................ උද්දීපනයට පත් කළහ.

(V) චීනය හා ඉන්දියාව අසියාවේ යෝධයන් සේ ......................... සමෘද්ධියට පත්වෙමින් සිටියි.

(VI) සරාසඳ තරු රැස සමඟ උදා වී නුබ ............................ ආලෝකමත් කළේය.

.(ප්‍රබුද්ධ / දේශපාලන / ගර්භය / ප්‍රසිද්ධ / ගැබ / ආර්ථික) (ලකුණු 03යි)

(B) තද කළු අකුරින් දක්වා ඇති බහු අර්ථ පදය යොදා වෙනත් අරුතක් දෙන ලෙස වාක්‍යය බැගින් තනන්න.

(i) ඔහු කියත් තුල රැගෙන ගෙන් ගෙට ගොස් විකුණා ජීවත් විය.

(ii) හස්තිරාජයා තම දළු දෙකෙන් පර්වතයට ඇන්නේය.

( iii ) ගත සිත සනසා ගනු පිණිස ඔහු භාවනාවට යොමු විය.

(iv) ගැහැණිය ගමට යනු වස් බස් රියට නැගුණාය.

(v) අගෝස්තු මස 31 දින රජයේ නිවාඩු දවසකි.

(vi) මුවදෙව්දා වත බණ්ඩ කාව්‍යයකි.

(06) තද කළු අකුරෙන් දී ඇති පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායේ අනු අංගය දක්වන්න.

(1) කම්කරුවා වනයේදී මං මුලාව ගවයකු ඇල්ලීය.

(කම්කරුවා - සමාස, වනයේදී - විභක්ති, මංමුලා - සන්ධි)

(2) රටේ අභිවෘද්ධිය සඳහා මනා පෞරුෂයකින් හෙබි යෞවන සමාජ දැන් දැන් අත්‍යවශ්‍ය වේ.

( අභිවෘද්ධිය - සමාස, උපසර්ග / යෞවන - තද්ධිත / අත්‍යවශ්‍ය - සනධී උපසර්ග)

(3) සුරංගනාවෝ නුවනත මෙන්ම වරලසද සුවඳ ජලයෙන් සේදූහ.

(සුරංගනා - සනධී වරලස - තද්ධිත සුවඳ - උපසර්ග)

(4) සොරමුළ රන්රිදී අබරණ ගෙන තාප්පයෙන් පැන පලා ගියහ.

(සොරමුළ - සමාස / විභක්ති, සමූහාර්ථව / රන්රිදී - සමාස / තාප්පයෙන් - විභක්ති)

(5)නිර්දෝෂි සිසුන් සිරගෙට දැම්මොත් අපි හෙට සටනට බසින්නෙමු.

(නිර්දෝෂි - සාමාස, උපසර්ග / දැම්මොත් - ක්‍රියා / හෙට - නපි ාත

(07) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කාශ්‍යපයෝ සූර්යයා අස්තංගත වන සන්ධ්‍යා යාමයේ සීගිරි පර්වතයේ අවරගිර පාර්ශවයෙහි ගල්තලාවක් මත අසුන්ගෙන සිටියහ. තම සහෝදරයා ජම්බුද්වීපයෙන් මහා සේනාවක් ගෙන තමාට හිමි රාජ්‍යත්වය ලබා ගැනීම පිණිස මේ භූමිය ආක්‍රමණය කිරීමට පැමිණෙමින් සිටින බව චරපුරුෂයන් ඔහුට දැනුම් දී තිබිණ. සැබැවින්ම මේ ස්වභාවාලංකාරයෙන් රමණීය පර්මත බලකොටුව යුද්ධමය වශයෙන් වැදගත් යැයි ඔහු කිසි විටෙක නොසිතුවේය. මෙය සතර අතින් වට කළොත් සියලු සැපයුම් මාර්ග අවහිර වනු ඇත. එවිට සුරතින් කඩුව ගෙන ගෙල සිඳ ගැනීම හැර වෙන විකල්පයක් නොමැත. තම ජීවිතය විනාශ

වූයේ නමුදු මේ ආහල් ාදජනක රම්‍ය කලා නිකේතනය මනෝරඤ්ජනීය වූ සිත්තම් පෙළ වැනසෙනු දැකීමට ඔහු ඉඩ නොදෙන්නෙමු

(I) පාපිලි සහිත පද 03ක් ඡේදයෙන් උපුටා දක්වන්න.

(II)සීගිරිය,සිතුවේය,විකල්පයක් යන්නෙහි පිල්ලම් නම් කරන්න.

(III) ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.

1. රකාරාංශය හා මූර්ධජ අක්ෂරයක් සහිත වචනයක්

2. නාසික්‍යාක්ෂර තුනක් අන්තර්ගත වචනයක්

3. ඝෝෂ තාලුජ ව්‍යංජනාක්ෂරයක් හා යංශය සහිත වචනයක්

(IV) පහත සඳහන් පද විසන්ධි කර සන්ධි විධිය දක්වන්න.

ස්වභාලංකාර, සුරතින්, සිත්තම්

(V) පහත දක්වෙන ක්‍රියාපදවලට උදාහරණ වචනය බැගින් බැගින් ඡේදයෙන් උපුටා දක්වන්න.

මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා (අතීත බහු වචනයක්), අසම්භාව්‍ය ක්‍රියා (ල.3515)

(08) පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(I) පූර්වස්වර ලෝප සන්ධිය

(II) පූර්ව ක්‍රියා

(III) විශේෂණ සමාසය

(IV) අනම්‍යකරණය

(v) කණ්ඨජ අක්ෂර (ලකුණු 3 × 5= 15යි)

# පිළිතුරු පත්‍රය ( විෂයය - සිංහල)

## i - කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 01 | 02 | 11 | 05 |
| 02 | 5 04 | 12 | 02 |
| 03 | 02 | 13 | 04 |
| 04 | 05 | 14 | 02 |
| 05 | 01 | 15 | 05 |
| 06 | 05 | 16 | 04 |
| 07 | 02 | 17 | 02 |
| 08 | 02 | 18 | 03 |
| 09 | 01 | 19 | 02 |
| 10 | 04 | 20 | 03 |

(ලකුණු 20යි)

## ii - කොටස

(02)(i) ස්ථවිරවාද බුද්ධාගම නිසා / ථේරවාදය නිසා

(ii) සාමූහික ලෙස සිදු කරන ආගමික වැඳුම් පිදුම්වලින් තොරවූ වතාවත් අඩු ධර්මයක් වීම.
යාඥාවට හෝ උත්තර මානුෂීය බලය ඇති අයට කරන ආයාචනයකට හෝ තැනක් නැතිවීම.

(iii) (පෞද්ගලිකව කෙරෙන ආත්ම දමනයෙන්) ආධ්‍යාත්මික පාරිශුද්ධිය ලැබීම.
(සංස්කාරයන්ගේ අනිත්‍ය මෙනෙහි කිරීමෙන්) නෛෂ්ක්‍රම්‍ය පුහුණු කිරීම.

(iv) ජන ඇදහීම් හා හින්දු විශ්වාස සමඟ සංකලනය වීමෙන්

(v) ආධ්‍යාත්මික පාරිශුද්ධිය - අභ්‍යන්තරයේ / ඇතුළත පිරිසිදු බව /සිතෙහි පිරිසිදු බව / මානසිකව ඇතිවන පිරිසිදු බව

නෛෂ්ක්‍රම්‍යය - ගිහි ගෙයින් නික්මීම, ගිහිගෙය අතහැර යෑම / අබිනික්මන / අභිනිෂ්ක්‍රමණය

(ලකුණු 10යි)

**(ආ)** සාහිත්‍ය කෘතියක සමාජීය ඇගයීම මෙන්ම සාහිත්‍යාංගයන්හි ජනප්‍රියත්වය ද වරින් වර වෙනස් වේ. ඇතැම් ශ්‍රේෂ්ඨ කෘති කතුවරයා මැරුණු පසු ජනප්‍රය වන අතර, ලේඛකයා සිටියදීම අභාවයට යන කෘතිද ඇත. සමහර කෘති සර්වකාලීනව පැසසේ. සමහරක් පළ වූ දේශයෙන් පිටත ජනප්‍රිය වේ. ඉන්දියානු චිරන්තන සාහිත්‍යය හා විචාරය කලින් කල ජනප්‍රිය වීම සහ නොවීම සිදු විය. සිංහලයන් අඩුවෙන්ම දන්නේ සහෝදර දෙමළ ජනතාවගේ සාහිත්‍යයයි. ඉහත වෙනස් වීම්වල ස්වභාවය, හේතු සාධක විමසීම මෙම අධ්‍යයනට අයත් වේ.

(වචන 87) (ලකුණු 15යි)

01

(04)(අ) (I) මිතුරන් විසනි් මගේ සවු දුක් බැලිණි
/බලන ලදී (II) ගං වතුරින් අනාථවූවන්
කවුරු ලබා ගනිත්ද?
(III) මා ජයග්‍රහණය නොකළොත් මිතුරිය දුක්වන්නීය.
(IV) නිවරැදි වාක්‍යයකි.
(V) අපි සයි ලේ ලෝම පෝයට අනුරාධපුරයට ගියෙමු. (ලකුණු 05යි)

(ආ)(I) ඇතැම් වෙළෙන්දන් විසනි් පාරිභෝගිකයෝ රැවටෙති / රවටනු ලබති / රවටනු ලබත් / රවටනු ලැබෙත්
(II) අතීතයේ වැද්දන් විසනි් සොරබොර වැවාණෝ හොඳින් රැකබලා ගැනුණු / ගැණුනාහ / ගැණුනේය /
ගනන් ා ලදහ / ලදේ දාය් / ගනු ලැබූහ / ලැබුවොය් .
(III) අක්කා විසනි් තම නංගීට මල් කිනිත්තක් දෙනු ලබයි / දෙනු ලැබේ.
(IV) මුරකරුවා විසනි් නියමිත වේලාවට සනී්‍ව ගැසේ / ගසනු ලබයි / ගසනු ලැබේ.
(V) හෙදිය විසනි් රෝගී දරුවෝ සැනසණු / සැනසණු හ / සැනසමු ණෝය / සනසන ලදහ / සනසන ලදේ දාය් / සනසනු ලැබූහ)
(ලකුණු 05යි)

(ඉ) (I) කරුවන්
(II) සපයන්නන්
(III) කරන්නන්
(IV) එන්නීය
(V) සෙක් රයෝ (ලකුණු 05යි)

(05)(අ) (I) යමක් කෙළින් නොකියා වෙනත් අයුරකින් කීම / ඉදිරිපත් කිරීම
(II) සව් කයී / සයි / තම රටෙහි් හා වෙනත් රටවල
(III) භික් ෂුණි ආරාමයක / භික් ෂුණීන් උදෙසා කළ ආරාමයක
(ලකුණු03යි)

(ආ) (I) බහුශ්‍රැත / බහුසස් තු
(II) අත්තනෝමතික
(III) දේශද්‍රෝහී / දේශද්‍රෝහියා (ලකුණු03යි)

(ඉ) (I) ප්‍රබුද්ධ
(II) ප්‍රසිද් ධ
(III) දේශපාලන
(IV) ගරහය
(V) ආර්ථික
(VI) ගැබ (ලකුණු03යි)

(ඊ) ( ) මෙවර හේනේ **තුල** පුරන බව තාත්තා කීවේ
ය. ( ) කිඳුරියළ කිඳුරා **තුළ** නිව II සෝගින්නෙන්
හැඬුවාය.
( ) හිටි හැටියේ වැස්ස වසනි් නට පටන් II **ගතු**
( ) IV **වස්** කාලයේ කෙරෙන පිංකම් සඳහා බොහෝ දෙනා සහභාගි වෙති.

02

( ) V**මස**රසට ම පුරුදු වූ බල්ලා වෙනත් අහර කෑමට කැමැත්තක් නොදක්වයි.

(vi) සුදු **වතු**ැදි කත විහාරයට ගියාය. (ලකුණු 06යි)

(06)

| | අංගය | අනු අංගය |
|---|---|---|
| (I) කම්කරුවා | සමාස | කර්ම විභක්ති සමාස |
| | විභක්ති | ප්‍රථමා විභක්ති |
| (II) වනයේදී | විභක්ති | අධාර විභක්ති |
| මං මුලා | සන්ධි | ග්‍රාත්‍රාක්ෂර ලෝප සන්ධිය |
| (III) සුරංගනාවෝ | සන්ධි | සමාන ස්වර දීර්ඝ / ස්වරාදේශ සන්ධිය |
| වරලස | තද්ධිත | සමාර්ථය / එයම යන අර්ථය |
| සුවඳ | උපසර්ග | වඩා යන අර්ථය / අධික යන අර්ථය / භූෂණර්ථය |
| (IV) සොරමුල | සමාස / විභක්ති | සම්බන්ධ විභක්ති සමාසය |
| | සමූහාර්ථ | ප්‍රථමා විභක්තිය |
| | | ප්‍රාණවාචී |
| රන්රදී | සමාස | දකාරාර්ථ සමාසය |
| තාප්පයෙන් | විභක්ති | අවධි විභක්තිය |
| (V) නිර්දෝෂි | සමාස / උපසර්ග | අව්‍ය සමාසය / නිෂේධාර්ථය |
| දුම්මොත් | ක්‍රියා | අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා |
| හෙට | නිපාත | කලාර්ථයේ |
| | | (ලකුණු 3 × 5= 15යි) |

(07)(I) යුද්ධමය , දුනුම්, සියලු

(II) සීගිරිය - දීර්ඝ ඉස්පිල්ල, කෙටි ඉස්පිල්ල, කෙටි ඉස්පිල්ල

සිතුවේය- කෙටි ඉස්පිල්ල, කෙටි පාපිල්ල, කොම්බුව හා හල් කිරීම

විකල්පයක් - කෙටි ඉස්පිල්ල

(III)1. අභිනිෂ්ක්‍රමණය

2. මනෝරඤ්ජනීය

3. රාජ්‍යත්වය

(IV) ස්වභාව + අලංකාර (ස්වරාදේශ සන්ධිය)

සුරු + අතින් (පූර්ව ස්වර ලෝප සන්ධිය)

සිත් + කම් පූර්වරූප සන්ධිය (V) මිශ්‍ර කියා -

පැමිණෙමින් අවසාන ක්‍රියා - සිටියහ

අසම්භාව්‍ය ක්‍රියා - කළොත් (ලකුණු 3 × 5= 15යි)